**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 ජුනි 09 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ 2013 මැයි 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) 2013 දෙසැම්බර් මාසයට අදාල රු. 56,500 ක ලැබිය යුතු මන්ත්‍රී දීමනා සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ඌණතාවය රු.56,500 ක් වැඩියෙන් ද, 2013 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් රු.56,500 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ඉටුකරන ලද කර්මාන්ත හතරකට අදාල නිමි වැඩ වටිනාකම රු.1,550,061 ක් වුවද, ඇස්තමේන්තුගත වටිනාකම වූ රු.1,659,027 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා, 2013 දෙසැම්බර් 31 දිනට ණයහිමි වටිනාකම රු.108,966 ක් බැගින් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ඉටු නොකරන ලද කර්මාන්ත දෙකක් සඳහා ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් හා ණයහිමියන් රු.134,000 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.2.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,834,380 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.5,718,028 ක් විය.

1.2.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**
-----------------------------------

වටිනාකම රු.26,931,853 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු හා පැවරුම් නියෝග ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.2.4 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**
---------------------------------------------------

සභාවේ සේවය කර සේවය හැර ගිය හා අය නොවීමට හේතුව නොදන්නා සේවකයින් / නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.42,462 ක සේවක ණය ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති වල නියමයන් අනුව අයකර ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,291,192 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,190,526 ක් විය. ඒ අනුව රු.899,334 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| බදු | 114,286 | - | 114,286 | |
| කුලී | 2,129,205 | 1,291,790 | 837,415 | |
| බලපත්‍ර ගාස්තු | 626,125 | 786,998 | (160,873) | |
| සේවා සඳහා ගාස්තු | 544,956 | 679,700 | (134,744) | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 195,759 | 1,613,554 | (1,417,795) | |
| වෙනත් ආදායම් | 690,902 | 479,968 | 210,934 | |
| ආදායම් ආධාර | 9,058,667 | 5,977,169 | 3,081,498 | |
| | | | | 2,530,721 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| වැටුප් හා දීමනා | 8,882,849 | 6,149,551 | (2,733,298) | |
| ගමන් වියදම් | 288,605 | 205,422 | (83183) | |
| සැපයුම් හා උපකරණ | 1,734,042 | 1,462,175 | (271,867) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 761,417 | 508,295 | (253,122) | |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 199,880 | 186,542 | (13,338) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 58,342 | 66,112 | 7,770 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 100,000 | - | (100,000) | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 43,573 | 60,556 | 16,983 | |
| | | | | (3,430,055) |
| | | අවාසිදායක විචලනය | | (899,334) |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 බලපත්‍ර ගාස්තු

(අ) සභා බල ප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගත යුතු වෙළඳ ආයතන හඳුනාගැනීම සඳහා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාන) රීති සංග්‍රහයේ රීති 67 ප්‍රකාරව වර්ෂය ආරම්භයේ දී සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද, 2013 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) 1988 අංක 56 සහ 2000 අංක 52 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 49 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර ලබාගත යුතු සහා බල ප්‍රදේශයේ පවතින කර්මාන්ත, ව්‍යාපාර ආදිය සමීක්ෂණයක් මඟින් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවිදඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 485,499 |
| මුද්දර ගාස්තු | 432,950 |
| | 918,449 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2013 වර්ෂයේ වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ගවල කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීමේ කර්මාන්ත ඉටුකිරීමෙන් පසු එකී මුදල් වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරන අතර වටිනාකම රු.4,000,000 ක් වන මාර්ග 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් ගිවිසුම් අත්සන් කර හෝ නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රිය වත්කම්**

(අ) හමුදා ක්‍රියාන්විත රාජකාරි සඳහා රැගෙන ගොස් නැවත 2008 මාර්තු 18 දින සභාව වෙත භාරදී තිබූ අංක 53-5072 දරන කැබ් රථය අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකොට එදින සිටම නිෂ්ක්‍රියව සහා භූමියේ රඳවා තිබුණි.

(ආ) 2005 මාර්තු 01 දින බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවෙන් ලබාදී තිබූ අංක 39-1387 දරන ත්‍රීරෝද රථය 2012 මාර්තු මාසයේ සිට කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදා නොගෙන සභා භූමියේ ගාල්කර තිබුණි.

(ඇ) සභාව සතු නිල නිවාස 02 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ජරාවාසව පැවතුනි.

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) සමාලෝචිත වර්ෂය තුල කර්මාන්ත 04 ක් සඳහා 2013 දෙසැම්බර් මාසයේදි රු.310,782 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබූ අතර, එම කර්මාන්ත 2014 ජුනි මාසය වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව හා ප්‍රජා පාදක සංවිධාන සමඟ එළඹෙන ලද ගිවිසුම් ප්‍රකාරව ඉටුකරන ලද කර්මාන්ත 06 ක් සඳහා අවස්ථා 08 කදී රු.2,099,079 ක මුදලක් ගෙවීම් කිරීමේ දී වෙනත් බාහිර පුද්ගලයන්ගේ නමින් චෙක්පත් නිකුත් කර තිබුණි.

3.4 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදු නොකරන අතර සභාව විසින් එක්රැස් කරනු ලබන කසල ආඳාඋල්පත පොල භූමියෙහි කපා ඇති වලකට අක්‍රමවත්ව බැහැර කරමින් පැවැතුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 09 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 21 දින ඉදිරිපත් කර තිබුණි.

4.2 **අයවැය පාලනය**

2013 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

| | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| **පුනරාවර්තන ආදායම** | | | | |
| බදු | 52,000 | 114,286 | 62,286 | 119.7 |
| කුලී | 139,110 | 2,129,205 | 1,990,095 | 143.0 |
| සේවා සඳහා ගාස්තු | 682,000 | 544,956 | 137,044 | 20.0 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 146,200 | 195,759 | 49,559 | 33.8 |
| වෙනත් ආදායම් | 263,750 | 690,903 | 427,153 | 161.9 |
| ආදායම් ආධාර | 7,423,825 | 9,058,667 | 1,634,842 | 22.0 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| වැටුප් හා දීමනා | 7,649,825 | 8,882,850 | 1,233,025 | 16.1 |
| සැපයුම් හා උපකරණ | 1,404,500 | 1,734,042 | 329,542 | 23.4 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 472,000 | 761,417 | 289,417 | 61.3 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 70,000 | 58,342 | 11,658 | 16.6 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 90,000 | 100,000 | 10,000 | 11.1 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 25,000 | 43,573 | 18,573 | 74.2 |

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) කොන්ත්‍රාත් පාලනය